# ඉන්දියානු පවිත්‍ර ගංගා සංකල්පය

සුනිල් සරත් පෙරේරා

## ගංගා නිම්න ශිෂ්ඨාචාරය

සෑම ශිෂ්ඨාචාරයක්ම ඇති වූයේ ගංගා නිම්න භූමි ආශ්‍රිතවයි. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය මෙන් මිසරයේ නයිල් නිම්න ශිෂ්ඨාචාරය ද යුප්‍රටීස් හා ටයිග්‍රීස් නදී බඩව ගොඩ නැගුණු ශිෂ්ඨාචාර ද මෙයට උදාහරණ වෙයි. මහා වංශයට අනුව ආර්ය සංක්‍රමණයෙන් පසුව ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම අගනුවර ගොඩනැගුනේ මල්වතු ඔය මුවදොර අසල පිහිටි තම්බපණ්ණියේ හෙවත් තම්මැන්නාවෙහි ය. මෙය ශ්‍රී ලංකාවේ ගංගාශ්‍රිත ශිෂ්ඨාචාරයක ආරම්භයයි. වංශ කථාවන්ට අනුව විජය කුමාරයා තම්බපණ්ණි නගරය ඉදි කළ අතර ඔහුගේ අමාත්‍යවරු කදම්බ නදිය අසල අනුරාධ ග්‍රාමයත් ගම්භීර නදී ඉවුරේ අනුරාධ ග්‍රාමයට උතුරින් උපතිස්ස ග්‍රාමයත් පිහිටවූහ. පැරණි ලංකාවේ ශිෂ්ඨාචාරයට අනුව අනුරාධපුරය සහ පොළොන්නරුව යන මධ්‍යස්ථාන දෙක මතුවිය. ඉන් එකකට මල්වතු ඔය හා කලාඔය පදනම් වූ අතර අනික පෝෂණය වූයේ මහවැලි ගංගාවෙන් සහ ඒ ආශ්‍රිත ජල සම්පාදන ක්‍රියාවලියෙනි.

ලෝකයේ විවිධ රටවල ගංගා නිම්න ආශ්‍රිතව ඇති වූ ශිෂ්ඨාචාර අතර කිසියම් සම්බන්ධතාවක් ඇති බවට ඇතැම් ඉතිහාසඥයෝ තර්ක කරති. පුරාවිද්‍යා මූලාශ්‍ර බොහෝ විට මෙයට පාදක වෙයි. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය ඉන්දු ගඟබඩට පමණක් සීමාවූවක් නොවන බවට මේ අනුව පැහැදිලි වෙයි. ඉන්දියාවේ සින්ධ් ප්‍රදේශයේ පැවති මෙම ශිෂ්ඨාචාරය ඊජිප්තුවේ සහ මෙසපොටේමියාවේ පැවති පැරණි ශිෂ්ඨාචාරවලට සමකාලීන වන්නට ඇතැයි පුරාවිද්‍යාත්මක කරුණු ආශ්‍රයෙන් නිගමනය කරනු ලැබේ. ඇතැම් ඉතිහාසඥයෝ මෙම ශිෂ්ඨාචාරය හා යුප්‍රටීස්, ටයිග්‍රීස් හා නයිල් නිම්න වල පැවති ශිෂ්ඨාචාර අතර කිසියම් සාම්‍යයක් ද දකිති.

මහා ශිෂ්ඨාචාර ගොඩනැගූ ගංගා හා ගංගා නිම්න විවිධ වූ මානව ක්‍රියාකාරකම් නිසා දූෂණයට පාත්‍රව ඇති බව ලෝ පුරා දක්නට ලැබෙන තත්ත්වයකි. දකුණු ආසියානු කලාපයේ ඇතැම් ගංගා පාරිසරික දූෂණය නිසා මළ ගංගා බවට ද පත්වී ඇත. ගංගා පවිත්‍රතාව පිළිබඳව ආසියානු රටවල් ක්‍රියාත්මක කරන සැලසුම් හා ක්‍රියාකාරකම් අප රටට ද ආදර්ශයක් කරගත හැකිය. පිලිපීනයේ මැනිලා නගර මැදින් ගලා බස්නා පාසිග් නදිය (Pasig River) පවිත්‍ර කර ගැනීම සඳහා පිලිපීන රජය හා ජනතාව ගනු ලබන ක්‍රියාවලිය මෙන්ම ඉන්දියානු පවිත්‍ර ගංගා වැඩසටහන යටතේ සිදුවන ක්‍රියාවලිය ද අධ්‍යයනය කිරීමෙන් ලද අත්දැකීම් මේ ලිපිය ලිවීමේ දී වැදගත් විය.

ඉන්දියානු පවිත්‍ර ගංගා වැඩසටහන ශ්‍රී ලංකාවේ ගංගා හා වැව් හා ජලාශ වලට ආදේශ කළ හැකි යෝග්‍ය ක්‍රියාවලියකි. පවිත්‍ර ගංගා වැඩසටහන වඩාත් වැදගත් වන්නේ එය භෞතික ක්‍රියාවලියක් මෙන් ම අර්ථාන්විත සංස්කෘතික හා සන්නිවේදන ක්‍රියාවලියක් ද වන නිසාය.

ඉන්දියානු පවිත්‍ර ගංගා වැඩසටහන බහු විධ වැඩපිළිවෙලක් සේ සැලකිය හැකිය. ගංගා නදී ක්‍රියාත්මක සැලැස් ම 1986 ජූලි 14 දින රජීව් ගාන්ධි විසින් ආරම්භ කෙරුනි. මෙහි මූලිකම ක්‍රියාකාරකම වන්නේ ගංගාවන්ට නගර වලදී එකතු වන අප ජලය පොම්පාගාර මගින් ඒකරාශී කර පිරිපහදු කිරීමේ සරළ ක්‍රියාකාරකමයි. මෙම පිරිපහදු කිරීම සඳහා කිසිදු රසායනික ද්‍රව්‍යයක් භාවිතා නොකරයි. මෙය සිදුවන්නේ ස්වභාවිකවය.

ජල ප්‍රශ්නය ඉදිරි දශක කීපය තුළ දී අපට මුහුණ පෑමට සිදුවන ප්‍රධානතම පාරිසරික ප්‍රශ්නයක් බවට හඳුනාගෙන ඇත.

අන්තර්ජාතික වශයෙන් මෙම ප්‍රශ්නය පිළිබඳව පසුගියදා දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවර පැවති ධරණීය සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේ දී ද අවධානය කෙරුණි. ධරණීය සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විය යුතු වැඩ සටහන්වලදී ජල හිඟය හා ජල සම්පත් දූෂණය පිළිබඳ ප්‍රශ්නය පුමුඛතා දිය යුතු ප්‍රශ්නයක් සේ සැලකිල්ලට ගත යුතුය.

මෙම කලාපයේ සෙසු රටවල ගංගාවල දක්නට ඇති පාරිසරික ප්‍රශ්න හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ ගංගා හා ජලාශ වලට අප ද්‍රව්‍ය මුදාහැරීම නිසා සිදුවන බලපෑම් කාරුණිකව ක්‍රියාකිරීමෙන් වළක්වා ගත හැකි තත්ත්වයක පවතින බව පැහැදිලි වෙයි.

භාරත දේශ වාසීහු ගංගාවෝ මහත් භක්තියෙන් යුතුව ආරක්ෂා කරගත්හ. ලෞකික මෙන්ම ලෝකෝත්තර ශාන්තිය පතා ගංගාවන්ට වැඳුම් පිදුම් කළහ. ගංගාවක් යනුවෙන් හඳුන්වන්නේ අති විශාල සම්පතකි. ගංගාවක් යනුවෙන් හඳුන්වන්නේ සාමාන්‍ය භෞතික සම්පතක් නොවන අතර භාරතීයයෝ එම ගංගා තුල දිව්‍යමය බලයක් ඇතැයි විශ්වාස කරති.

ඉන්දියානු ගංගා අතරින් ගංගා හා යමුනා දේවතාවියක් සේ පූජනීයත්වයට පත්ව ඇත.

ඉන්දියාවේ ප්‍රධානතම ගංගාව වශයෙන් සැලකෙන ගංගා නදිය ආර්ථික, ආගමික හා සංස්කෘතික වශයෙන් ද ඉතා වැදගත් ස්ථානයක් උසුලයි.

කි. මී. 2491 ක් දිග මේ ගඟට ආසියාවේ ගංගා අතරින් දිගින් 15 වැනි ස්ථානය ද ලෝකයේ ගංගා අතරින් 39 වැනි ස්ථානයට ද පත්වෙයි.

හිමාලය කඳුවැටියේ හිම ගුහා වලින් ආරම්භ වන ගංගා යමුනා ගංගා දෙක අලහබාද් සිට එක්ව ගලාබසී.

හිමාලයේ හිමහිරි ශිඛර වලින් ආරම්භ වන ගංගා නදිය ආරම්භයේ දී භගීරථය සහ ආලකනන්දා යැයි ප්‍රධාන මූලශාඛා දෙකකින් පෝෂණය වෙයි.

මේ හැර මන්දාකිණී, ධෞලී සහ පිණ්ඩර් යන මූල ශාඛා තුනක් ද එයට ඇත. ගංගානම් නදියට සම්බන්ධ භගීරථී ශාඛාව "ගංගෝත්‍රී" නම් ග්ලැසියරයන් පාමුල හිම ගුහාවකින් ආරම්භ වෙයි.

"ගංගෝත්‍රී" පිහිටා ඇත්තේ මුහුදු මට්ටමේ සිට මී. 3090ක් ඉහළින් පිහිටි තේහ්රි - ගර්හ්වාල් දිස්ත්‍රික්කයේය. ගංගා නම් ගඟේ අනෙක් මූල ශාඛාව වන අලකනන්දා ශාඛාව උත්තර ප්‍රදේශයේ නන්දාදේවී කඳුවැටියට කි. මී. 48න් උතුරින් පිහිටි ගරහග්වාල් දිස්ත්‍රික්කයේ ටිබැට් සානුවට නුදුරින් ආරම්භ වෙයි.

"දේවපායාගය" නම් ස්ථානයේදී මෙම ගංගා දෙක එකතු වී මෙන් පසු ගංගා නදිය බවට පත්වී හිමාලය කඳු වැටියේ දකුණු කෙළවරේ පිහිටි ශිවාලික් කඳු හරහා ගාලාවිත් රිසිකේෂ් ඔස්සේ හරිද්වාර් සම භූමිය පසුකර භාරතීයයන්ගේ ජීවන ගංගාව ලෙස ගම් නියම්ගම් මහා නගර පසුකර බෙංගාල බොක්කෙන් මුහුදට පතිත වේ.

ඉන්දියානු පවිත්‍ර ගංගා වැඩ සටහනට පදනම වැටුනේ ගංගා නදී පවිත්‍රතා වැඩ සටහන මගිනි. ගංගා නදී පවිත්‍රතා වැඩ සටහන මෙහිදී විමර්ශනයට ලක් කිරීම වැදගත්වෙයි. ගංගා නදී



ඉන්දියානු පවිත්‍ර ගංගා වැඩසටහන පිළිබඳ අධ්‍යයන චාරිකාවට එක් වූ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍ය ගරු රුක්මන් සේනානායක මැතිතුමා ඇතුළු දූත පිරිස



නිම්නයේ කල අධ්‍යයන චාරිකා දෙකක් ඇසුරෙන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කෙරේ.

ඉන්දියානු මහා ශිෂ්ඨාචාරයේ ජන්ම භූමිය වශයෙන් සැලකෙන ගංහා නදිය හා ජලය පූජනීයත්වයට පත්වූයේ ද එහි ඇති වටිනාකම පුරාණ කාලයේ පටන් ජනතාව අවබෝධ කරගත් නිසාය. හිමාලය පර්වතයෙන් පටන් ගන්නා ගංහා නම් නදියේ ජලය ඉතා ශුද්ධ ලෙස දඹදිව වාසීහු සලකති. ගංහා නම් ගඟ දියට මළවුන්ගේ ඇට දැමීමෙන් මළවුන් දෙව්ලොව උපදිතැයි හින්දූහු සලකති.

ගංහා නම් නදිය දෙව්ලොව වසන විෂ්ණුහුගේ පයෙහි මහපටැගිල්ලෙන් පටන් ගෙන, කෙලාසකූටයෙහි වසන මෙහෙසුරාගේ ජටාවට බැස එය තුන්වරක් පැදකුණු කොට පොලොවට වැටී "ගංහා" නාමයෙන් ප්‍රචලිතව මුහුදට වැටෙන බව ඔවුන්ගේ විශ්වාසයයි.

ගංහා නම් නදිය හා ගංහා නම් නදී ජලයේ පාරිශුද්ධත්වය සලකා ගඟට හා ගඟ දියට කරන පුද පූජාද කොතෙකුත් දක්නට ඇත.

ගංහා නම් ගඟ ආරම්භ වන ස්ථානයට සමීප හිමාලය කඳු පාමුල පිහිටි හරිද්වාර් හිදී ගංහාව වෙනුවෙන් කෙරෙන උත්සවයක් 1997 අප්‍රේල් 13 දින නිරීක්ෂණ චාරිකාවේ දී මාහට ද දැක ගන්නට ලැබුණි.

මෙම උත්සවය හඳුන්වන්නේ බයිසාකි යන නමිනි. (BAISAKHI) බන්ජාබි වැසියන් ගොවි තැන් කටයුතු ආරම්භ කිරීමට පෙර මෙම උත්සවය ගංහාව වෙනුවෙන් වාර්ෂිකව පවත්වනු ලබන්නකි. ගඟ බඩ හරිද්වාර් පුර දොර පිහිටි හර්කිජෝර් නමැති ස්ථානයට හිරු අවරට යන සැඳෑසමේ එක් රොක්වන පන්ජාබි වැසියෝ (සීක්වරු) සවස 7 ට පමණ පැවැත්වෙන ගඟ බඩ දෙවොලේ පූජා අවස්ථාව එනතුරු සැදැහැති සිතින් බලා හිඳිති.

කොලයක් මත මල් පහන් තබා පා කර හරින ප්‍රදීප පූජාව (දීපක් පූජාව) කාන්තාවන් විසින් මෙහිදී සුලබ වශයෙන් කරනු ලබන පුද සිරිතකි.

දෙවියන්ගේ පාදය යනුවෙන් හැඳින්වෙන හර්කිපෞරි (HARIKIPAURI) නමැති ස්ථානයේ දේවස්තෝත්‍ර ගායනා කරමින් පවත්වන මෙම පහන් පූජාව ( දීපක්) ඉතා වර්ණවත් අවස්ථාවක් සේ දැක්විය හැකිය.

ඉන්දියානුවන්ගේ පවිත්‍රවූත් ශුද්ධවූත් ගංහාවේ ජලය දූෂණය වීම නිසා ලෝකයේ අපවිත්‍රම ගංහාවන් අතරට පත්වීමේ තර්ජනය අසූව දශකය වන විට මතුවිනි. ඉතිහාසයේ නොවූ විරූ මෙම ස්වභාවය ඔරොත්තු නොදෙන නාගරීකරණය හා ජනගහනය වර්ධනය වැනි තත්ත්වයන් යටතේ ඇතිවූවක් සේ සැලකිය හැකිය. තුන්වැනි ලෝකයේ සෙසු මහනගර වලට බලපාන පාරිසරික ගැටළුවලට වඩා අහිතකර ස්වභාවයක් ගංහානම් ගඟ ආශ්‍රිත පාරිසරික ගැටළුවල දක්නට ලැබිණි.

ඉන්දියාවේ 3119 නගර හා මහ නගර අතුරෙන්, කසල ඉවත් කිරීමේ සහ කසල සකස් කිරීමේ පහසුකම් පූර්ව වශයෙන් ඇත්තේ 209 ක පමණි. අටකට පමණක් යම් යම් පහසුකම් තිබුණි.

ගංහා නදීබඩ නගර 114 (ජනයා 50,000 හෝ ඊට වැඩිය වෙසෙන) ජනකායකගේ කුණු කසල දිනපතා නදියට බැහැරලීම කෙරේ. D. D. T. සම්පාදම් කිරීමෙන් ඇතිවන අපද්‍රව්‍ය, රසායනික පොහොර, රබර් වෙනත් කම්හල් අපද්‍රව්‍ය ද ගංහා නම් නදියට මුදා හැරුණි.

කාන්පූර්, පැට්නා හා කල්කටා වැනි කාර්මික නගර වල දී ගංහා නම් නදිය මෙසේ කර්මාන්ත වලින් ඉවත දමන අපද්‍රව්‍ය නිසා වැඩි වශයෙන් දූෂණය වේ. කල්කටාව අසල හුග්ලි මෝය හා අවට ප්‍රදේශයේ කම්හල් 150 කට වැඩි සංඛ්‍යාවකින් නිකුත් වන සකස් නොකල කාර්මික අපද්‍රව්‍ය බල බලපෑම ද ගඟ මුහුදට වැටෙන්නට ආසන්නයේ දී වුව ද ඇතිවෙයි. පරිසර දූෂණ පිළිබඳ පාලක මණ්ඩලය මෙන් ම ගංහා නම් ගඟබඩ පිහිටි විශ්ව විද්‍යාල ද මැදිහත් වී කරන ලද විද්‍යාත්මක පර්යේෂණ මඟින් ද ගංහානම් ගඟේ ජල දූෂණය වලකා ගැනීම සම්බන්ධව විධිමත් ක්‍රියාත්මක සැලැස්මක් ඇති කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කර ඇත.

ගංහා නම් ගඟ වඩාත්ම දූෂණයට පාත්‍රවන්නේ ගඟ දෑලේ පිහිටි ප්‍රධාන නගර වලින් ගඟට මුදා හරින ලබන නාගරික අපද්‍රව්‍ය නිසා බව ද මෙහි දී අවධාරණය කර ඇත.

ගංහා නදී ක්‍රියාත්මක සැලැස්ම (GANGA ACTION PLAN) GAP 1986 ජූලි 14 වැනි දින අගමැති රජීව් ගාන්ධි විසින් ආරම්භ කෙරුණි. මෙම වැඩ සටහනේ මූලික අරමුණ වන්නේ ජල දූෂණය අවම කරගනිමින් ගංහා ජලයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීමයි.







දෛනිකව ගඟට නිවෙස් වලින් බැහැර කරන කසළ ජලය හා කාර්මික අපසන්දන මෙන් ම රසායනික අපද්‍රව්‍යය ද ඉවතලීමට පෙර පිලියම් හා පිරිපහදු කිරීම ද මෙගින් අපේක්ෂා කෙරේ.

ඉන්දියානු රජය මගින් ගංහා නම් ගඟ සම්බන්ධ කර පළමුව ක්‍රියාත්මක කළ ගංහා නදී ක්‍රියාත්මක වැඩ සටහන දැනට යමුනා ගඟ ද ඇතුලුව ජාතික ගංහා වලට අදාල වන ලෙස මෑත භාගයේ දී තවදුරටත් ව්‍යාප්ත කර ඇත.

මෙම පවිත්‍ර ගංහා වැඩ සටහනට පසුව ඇතුළත් වූ ප්‍රධාන ගංහා පහත දැක් වේ.

| | | | |
|---|---|---|---|
| 1. | බ්‍රහ්මපුත්‍ර | - | Brahmputra |
| 2. | ගංහා | - | Ganga |
| 3. | ඉන්දූස් | - | Indus |
| 4. | සබර්මතී | – | Sabarmati |
| 5. | මහී | – | Mahi |
| 6. | නර්මදා | - | Narmada |
| 7. | තාපිත් | - | Tapit |
| 8. | මහානදී | - | Mahanadi |
| 9. | බ්‍රහ්මනී | - | Brahmani |
| 10. | සුබර්නාරික | - | Subarnarekha |
| 11. | ගෝදාවරී | - | Godavari |
| 12. | ක්‍රිස්නා | - | Krishna |
| 13. | පිනාර් | - | Pennar |
| 14. | කාවේරි | - | Cauvery |

## ගංහා නදී ක්‍රියාත්මක සැලැස්ම - (Ganda Action Plan) පිළිබඳ පූර්ව අධ්‍යයනයක්

### පළමු අධ්‍යයනය

ගංහා නදී ක්‍රියාත්මක වැඩ සටහන ශ්‍රී ලංකාවට කොතෙක් දුරට ගැලපේ ද යන්න ගැන 1994 ජනවාරි මාසයේ පමණ දූත කණ්ඩායමක් විසින් අධ්‍යයනය කර ඇත.

ගංහා නදී ක්‍රියාත්මක සැලැස්ම පිළිබඳ මාගේ අධ්‍යයනය යෙදුනේ 1997 අප්‍රේල් මාසයේ දී ය.

රිශිකේෂ් ප්‍රදේශයේ පිහිටි අපද්‍රව්‍ය පිරිපහදුව සහ ජල පොම්පාගාරය ද අනුබද්ධ කසල නල පද්ධතිය ද මෙහි දී පරීක්ෂාවට ලක්විය. රිශිකේෂ් නගරය හින්දුන්ගේ අති පූජනීය ප්‍රදේශයකි. එය හිමාල කඳුවැටි පාමුල රමණීය පරිසරයක පිහිටි ශුද්ධ වූ ස්ථානයක් වශයෙන් ද සැලකේ. දිල්ලි නුවර සිට කිලෝමීටර 238 පමණ ජනගහනය 44500 පමණ වේ.

රිශිකේෂ් නගරයේ ක්‍රියාත්මක වන අපද්‍රව්‍ය පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ස්වර්ග ආශ්‍රම් නමින් හැඳින්වෙන ස්ථානයේ පිහිටා ඇත. යාත්‍රාවකින් ගඟ තරණය කර හෝ ලක්ෂමන් ජූලා සංගිලි පාලමෙන් එගොඩ වී හෝ මෙම ස්ථානය කරා ළඟාවිය හැකිය. ස්වර්ග ආශ්‍රම් ප්‍රදේශයට හිමාලය අඩවියේ වල් අලි ද පැමිණෙති.

ස්වර්ග ආශ්‍රම් ප්‍රදේශයේ ආශ්‍රම රාශියක් පිහිටා ඇත. ඉන්දියාවේ නොයෙක් දෙසින් පැමිණෙන වන්දනාකරුවෝ සහ විදේශීය සංචාරකයෝ ද මෙහි නිතර දකින්නට ලැබෙති.

බවුන් වඩන යෝගීන්ගෙන් ද පිරුණු ප්‍රදේශයක් වන මෙහි ගංහා නදී ක්‍රියාත්මක සැලැස්ම පටන් ගැනීමට පළමු අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැරලීමක් සිදු වී නොමැත. ගංහා නදිය හිමාලය කඳු වැටි වලින් සහ භූමියකට වැටෙන්නේ මෙහිදී වන අතර ගංහාව මුල් අවස්ථාවේ දූෂණයට පාත්‍ර වීම ගංහා නදී වැඩ සටහන ක්‍රියාත්මක වීමට පෙර දක්නට ලැබී ඇත.

ගංහා නදී දැලේ ආශ්‍රම විලින් සහ වෙළඳ සැල් වලින් ද ඉවතලන අපද්‍රව්‍ය ගඟට මුදා නොහැර නල පද්ධතියක් මගින් පොම්පාගාරයකට යොමු කිරීමත් මෙම පොම්පාගාරයේ සිට පිරිපහදුව වෙත යොමු කිරීමත් ගංහා නදී වැඩ සටහනේ පළමු අදියරේ දී ම සිදු කර ඇත.

රිශිකේෂ්හි ගංහා ජලය දූෂණය වීමේ වැඩ සටහනේ සර්ව ආශ්‍රම් පිරිපහදුවේ පළමු අදියරේ කටයුතු සඳහා රුපියල් ලක්ෂ 29.80 මුදලක් ඇස්තමේන්තු කර ඇත.

පාරම්පරික ඥානය හා දේශීය තාක්ෂණය ද උපයෝගී කර ගනිමින් නිෂ්පාදිත සර්වආශ්‍රම් අපද්‍රව්‍ය පිරිපහදුව ශ්‍රී ලංකාවේ කුඩා නගරවලට ආදේශ කළ හැකි දියරමය අපද්‍රව්‍ය පිළියම් කළ හැකි සාර්ථක සරල ක්‍රමයක් වශයෙන් හැඳින්විය හැකිය.

1985 ආරම්භ කරන ලද සර්වාආශ්‍රම් අපද්‍රව්‍ය පිරිපහදුව සඳහා වැය වී ඇති මුදල ඉන්දියානු රුපියල් ලක්ෂ 19.45 කි. මෙම පිරිපහදුවේ යන්ත්‍ර



සූත්‍ර සියල්ල ඉන්දියාවේ ම නිෂ්පාදිත ඒවා වීම ද වැදගත් වෙයි.

සර්ව ආශ්‍රම් අපද්‍රව්‍ය පිරිපහදුවේ අප ජලය පවිත්‍ර කිරීම සඳහා කිසිදු රසායනකික ද්‍රව්‍යයක් භාවිතා නොකරයි. එය සිදුවන්නේ ස්වභාවික ක්‍රියාවලියකට අනුවයි. පටියක ආධාරයෙන් භ්‍රමණය වන ජෛවමය ස්පර්ශක ක්‍රියාදාමයක් වශයෙන් හැඳින්විය හැකි මෙම යාන්ත්‍රණය ශිල්ප ක්‍රමය නාග්පූර්හි ජාතික පාරිසරික ඉංජිනේරු පර්යේෂණ ආයතනය විසින් වැඩි දියුණු කළ ඉංජිනේරු ක්‍රියාවලියක් වෙයි.

ජලයේ ජෛවමය ඔක්සිජන් ඉල්ලුම (BOD 5) දෙන ලද කාලයක් ඇතුලත ක්ෂුද්‍රජීවින් විසින් කාබනික ද්‍රව්‍ය ඔක්සිකරණය කිරීමේ දී වැයවන ද්‍රව්‍යමය ඔක්සිජන් (DO) ප්‍රමාණයේ මිණුම්) හා ද්‍රව්‍ය ඔක්සිජන් ජලයේ ජීවින් ජීවත් කරවීමේ හැකියාව මනින මිනුම් අවශ්‍ය ප්‍රමාණ පවත්වාගෙන යාම සඳහා ඉතා සරල ක්‍රමෝපායක් තුළන් ජලය කළඹා එයට අවශ්‍ය ඔක්සිජන් ප්‍රමාණය කැවීමක්, එම ක්‍රියාවලියට ලක් වූ ජලය අනතුරුව පල්දෝරු ටැංකි ක්‍රමයකට යොමුකර කිසියම් කලක් නිශ්චලව තබා සූර්ය තාපය ලබාදීම ආදී ක්‍රියාවලියක් තුළින් ජලය පවිත්‍ර කිරීමක් මෙහිදී ස්වභාවික ක්‍රමයකට අනුව සිදු කෙරෙයි.

මෙමගින් 90% කින් පමණ ජලයේ මිශ්‍රිත අපද්‍රව්‍ය ප්‍රමාණය අඩුකර ගතහැකි වේ.

### සර්වගාශ්‍රම් ජෛව තාක්ෂණික අපද්‍රව්‍ය පිරිපහදු ක්‍රමය ශ්‍රී ලංකාවට ආදේශ කිරීම

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 21.5% පමණ ජීවත්වන්නේ නාගරික යැයි සම්මත ප්‍රදේශවලය. මෙම වර්ග කිලෝ මීටර් 65610 ක් වන දිවයිනේ මුලු බිම් ප්‍රමාණයෙන් 0.5% පමණ ප්‍රදේශයකි. කොළඹ, යාපනය, මහනුවර නගරවල මෙන්ම කෑගල්ල, මාවනැල්ල, කඩුගන්නාව, පේරාදෙනිය වැනි නගරවල ද නාගරික අපද්‍රව්‍යය ඉවතලෑම දැනටමත් බලවත් ප්‍රශ්නයක්ව පවතී. කසල ජලය සම්හල්වලින් නිපදවෙන දියරමය අපද්‍රව්‍ය මුළුතැන් ගෙවල් මෙන් ම රෙදි පිරිසිදු කරන ස්ථානයන්ගෙන් ඉවත ලන අපිරිසිදු ජලය, කැලිකසල නාගරික වැසි ජල අවධාවනය ද මෙයට ඇතුළත් වේ.

කසල ජලය අපවහනය කරන නල පද්ධතියකින් සමන්විත එකම මහ නගර සහා ප්‍රදේශය වනුයේ කොළඹ පමණි.

කොළඹ නගරයේ ක්‍රියාත්මක වන අපද්‍රව්‍ය බැහැර කිරීමේ නල මාර්ග ක්‍රමය අනුව සිදුවන්නේ කිසිදු පිරිපහදු කිරීමකින් තොරව දියරමය අපද්‍රව්‍යය මුහුදලට කෙලින් ම බැහැර කිරීමකි.

ගැලුම් මිලියන 25ත් 30 ටත් අතර ප්‍රමාණයක් නිරතුරුව මුහුදට බැහැර කිරීම මේ අනුව සිදු කෙරේ. (පැය 24ක කාලය තුලම) මෙම ක්‍රියාවලිය සඳහා පොම්පාගාර 13ක් භාවිත යට ගැනෙන අතර මෙම පොම්පාගාර මගින් එකතු කෙරෙන අප ජලය උතුරු කොළඹින් හා (මාදම්පිටියෙන්) හා දෙහිවල ඇල මෝය අසලින් මුහුදට බැහැරලීම සිදු කෙරේ.

අප ජලය මුදා හරින පොම්පාගාර 13 ක පිහිටි ස්ථාන

1. වික්ටෝවයික් පාර
2. මාදම්පිටිය
3. වරාය
4. මාලිගාවත්ත
5. වනාතමුල්ල
6. බොරැල්ල
7. පොල්වත්ත
8. කොම්පඤ්ඤවීදිය
9. බම්බලපිටිය
10. වැල්ලවත්ත
11. කිරුළ
12. කුරේ ක්‍රීඩාංගනය
13. මාලු වෙළඳ පොල (පිටකොටුව)

පිරිපහදු කිරීමකින් තොරව මුහුදට මුදාහරින අපද්‍රව්‍ය නල මාර්ග ක්‍රමය වසර 100 කට ඉහත සිට ක්‍රියාත්මක වන්නක් බව සැලකීම මෙහිදී වැදගත් වේ. එමෙන් ම කොළඹ ක්‍රියාත්මක වන මෙම ක්‍රමය කිසිදු විදේශාධාරයක් නොලබා අපේ ම මුදල් යොදා (නාගාරික අයබදු මගින්) ආරම්භ කර පවත්වා ගෙන යන්නක් බව ද මෙහි දී අවධාරණය කිරීම වැදගත් වේ.

රට අභ්‍යන්තරයේ ඇති සම්පත් කෙරෙහි පමණක් විශ්වාසය තබා ක්‍රියාත්මක කෙරෙන රිෂිකේෂ්හි සර්වශ්‍රාශ්‍රම් පිරිපහදුව හා අපද්‍රව්‍යය නල පද්ධතිය දේශීය සම්පත් පමණක් නොව තාක්ෂණය ද උපයෝගී කර ගනිමින් පවත්වාගෙන යන්නක් බව මෙහි දී අවධාරණය කළ යුතු වේ.







නාගරික දූෂිත ජල අපහරණය මතුපිට ජලයට පමණක් නොව භූගත ජලයට ද බලපානු ලැබේ. කොළඹ නගරයට වඩා ප්‍රමාණයෙන් කුඩා වූ නගරවලද නාගරික ජල දූෂණ ප්‍රශ්නය ඇති මුත් ඒ කෙරෙහි අවධානය යොමු වී ඇත්තේ මද වශයෙනි. මහනුවර පේරාදෙනිය වැනි නගරවල ද කසල ජලය ඒවා ඇතිවන ස්ථානවලම මුදා හැරීම සිදු වේ. ජල සෝදක වැසිකිලිවලින් මෙන් ම නිවාස වලින් ද නගර මාධ්‍යයේ සිදුවන නානාවිධ දෛනික ක්‍රියාවලිය තුලින් ද මතුපිට ජලාපවහන ජාලයට කසල ජලය කෙලින් ම මුදා හැරීම සිදු වේ.

මෙම ක්‍රියාවලිය සියලු නගර හා තදාසන්න පෙදෙස්වල දක්නට ලැබේ. ජයවර්ධන පුරය ද මෙයට ඇතුළත් නගරයකි. එමගින් ඇල හා ජල මාර්ග විවෘත කසල ජල පද්ධති බවට පත් වී ඇත.

කසල නල පද්ධති නොමැති ඇතැම් නාගරික ප්‍රදේශවල ප්‍රධාන නිවාස යෝජනා ක්‍රමවලට අනුබද්ධව හා රෝහල් ආශ්‍රිතව කසල ජල පිරියම් පද්ධති ඇත. එහෙත් ඒවා ක්‍රියාත්මක වීම බොහෝ විට නිසි ලෙස සිදු නොවේ. මෙවැනි තත්ත්වයන් ඇති වීමට ජනාවබෝධය මෙන්ම ජනාවධානය ද නොමැතිකම ප්‍රබල ලෙස බලපායි.

මෙයට උදාහරණ රෝහල් කීපයක ක්‍රියාත්මක කෙරෙන අප ජලය පිරිපහදු මධ්‍යස්ථාන වලින් සොයා ගත හැකිය.

රත්නපුර, ඇල්පිටිය, කරාපිටිය වැනි රෝහල් වල අප ජලය පිරිපහදු කිරීමේ වැඩ පිළිවෙලක් ඇතත් මෙයින් බොහෝ රෝහල් වල නිසි අයුරින් ඒවා ක්‍රියාවට නොනැඟේ. ජනාවබෝධය මේ කෙරෙහි යොමු වන්නේ නම් මෙවැනි තත්ත්වයක් උද්ගත නොවෙන බවද පැහැදිලි වේ.

ඉන්දියාවේ පවිත්‍ර ගංගා වැඩ සටහනේ තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ජනතාවගේ ක්‍රියාකාරී සහභාගිත්වය විවිධ සන්නිවේදන ක්‍රමෝපායන් තුලින් ලබා ගැනීමයි. "ජල්නිගම්" ආයතන අනුබද්ධ ජනාවබෝධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන අතර රාජ්‍ය නොවන සංවිධාන හා පාසැල් වල ද නිබඳ සහාය මෙම ජනාවබෝධ වැඩ සටහන් සඳහා උපයෝගී කර ගනී.

නාගරික ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ නියමු ව්‍යාපෘති පිළිබඳව අප අවධානය යොමු වී ඇතත් නාගරික දියරමය අපද්‍රව්‍ය මුදා හැරීම පිළිබඳව සංවේදිතාවයකින් කටයුතු කිරීමක් නොමැති බව ද පැහැදිලි වේ.

දැනට විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක කෙරෙන ඉහල ජලාධාර සංරක්ෂණ ව්‍යාපෘතියේ මෙන් ම ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන පාරිසරික ක්‍රියාකාරී ව්‍යාපෘතිය ද වෙනත් විදේශාධාර ව්‍යාපෘතිවල ද සංවේදිතාව හා අවධානය මෙවැනි සරල යාන්ත්‍රණයක් ශිල්ප ක්‍රමයක් තුලින් ක්‍රියාත්මක කළ හැකි දියරමය අපද්‍රව්‍යයන් මුදා හැරීමේ ව්‍යාපෘති හා දේශානුරූපී ක්‍රියාවලීන් වෙත යොමුවීම වැදගත් බව මෙහිලා අවධාරණය කරමි.

### උත්තර ප්‍රදේශයේ වාරනාසි නගරයේ ජල්නිගම් (ජලමණ්ඩලය) මගින් ක්‍රියාත්මක කරන පවිත්‍ර ගංගා වැඩ සටහන

ගංගා නදී ක්‍රියාත්මක සැලැස්ම ඒ ඒ ප්‍රාන්තවල පිහිටි ජල්නිගම් (ජල පවාහන මණ්ඩල) නැමැති ආයතනවල ඍජු ක්‍රියාකාරිත්වය යටතේ සිදුවන්නකි.

උත්තර ප්‍රදේශයේ ජල්නිගම් (ජල මණ්ඩල) යටතේ ක්‍රියාත්මක වන වාරනාසී නගරයට සම්බන්ධ ගංගා නදී පවිත්‍රතා ක්‍රියවලිය අධ්‍යයනය කිරීමේ දී කෙටි කාලයක් තුල ගංගා ජලයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීමට ගෙන තිබූ සාර්ථක ක්‍රියාවලිය දැකගත හැකි විය.

වාරනාසී (බරණැස) පිහිටා ඇත්තේ ගංගා නදිය අසබඩය. මෙම නගරය ලෝකයේ පැරණිම නගරයක් වශයෙන් සැලකිය හැකිය. මෙහි 1917 සිට ක්‍රියාත්මක වන පල්දෝරු ක්‍රමයක් පැවති නමුදු ඍජුවම නිවාස වලට හා වෙළඳ සැල් ඇතුලු නගරයේ එක්රැස්වන අපද්‍රව්‍ය ගඟ දෑලේ විවෘත කානු මගින් අපද්‍රව්‍ය ගඟට බැහැරලීම සිදු වී තිබේ. අසීනාල යනුවෙන් හැඳින්වෙන මෙම විවෘත කානු පද්ධතිය මගින් "රාම් නගර්" ප්‍රදේශයේ දී ගඟ දියට විශාල වශයෙන් අපද්‍රව්‍ය එකතු වී ඇත. රාම් නගර් ප්‍රදේශයේ පමණක් විවෘත කානු 7කින් මෙම අප ජලය කෙලින් ම ගඟට වැටුණි.

වාරනාසී නගරයේ ගාට් ප්‍රදේශයේ වැඩි වශයෙන් ගංගා නදිය දූෂණය වන කලාපය සේ සැලකිය හැකිය. හින්දුන්ගේ අති පූජනීය ප්‍රදේශයක් වන වාරනාසි හි ගාට් ප්‍රදේශය තුළ මළමිනී පුළුස්සා ගඟට දැමීම ද බහුල වශයෙන් සිදු වේ. දැනට වසර හතරකට පමණ පෙර බාගෙට පුළුස්සා



ගඟ දියට මළමිනී පාකර හරිනු බට ද දැකගත හැකි විය.

ආසී ගාට් ප්‍රදේශයේ සිට රාජ්ගාට් දක්වා ගඟ දියේ යාත්‍රාවකින් කල චාරිකාවේ දී ගාට් ප්‍රදේශයේ (ගංගා නදිය බඩ) මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකර ඇති සීඝ්‍ර වෙනස් කම් දැකගත හැකිවිය. දිනකට හැත්තෑ දහසක් පමණ ජනයා ගාට් ප්‍රදේශයේ ස්නානය කරන බව පැහැදිලි විය. ශිව දෙවියන් උදෙසා කල "කාසි විශ්වනාථ දේවාලය" අසල වැඩ ජන සංඛ්‍යාවක් ස්නානය කරති.

ගංගා නදී ව්‍යාපෘතිය යටතේ (පළමු අදියර යටතේ) වාරනාසී නගරයේ පැරණි ජල පවාහන නල පද්ධතිය මධ්‍යම ජල පිරිපහදුව වෙත යොමු කර පවිත්‍ර කිරීමේ කටයුතු සාර්ථකව සිදු කෙරෙයි.

සර්වග්‍රාශ්‍රම් පිරිපහදුවේ හිදී කෙරෙන ක්‍රියාවලියට සමාන වූ දේශීය තාක්ෂණය යොදා කෙරෙන ක්‍රියාවලියකින් වාරනාසී නගරයේ ජල පිරිපහදුවේ කටයුතු ද සිදු කෙරෙයි. වාරනාසී නගරයේ විශාලත්වය හා ජනගහනය අනුව මෙහි ක්‍රියාවලිය සර්වග්‍රාශ්‍රම් ක්‍රියාවලියට වඩා මඳක් සංකීර්ණ එකක් බව ද දැක්විය හැකිය. (වාරනාසී ප්‍රදේශය ලක්ෂ 12 කට ආසන්න ජනගහනයක් දක්නට ඇත.)

ගාටස් ප්‍රදේශයේ දී පොම්පාගාර 6 කින් ජලය පිරිපහදුව වෙත යොමු කෙරේ. හරිස්චන්ද්‍ර ගාට්ස් හා මානි කනිකා ගාට්ස් ප්‍රදේශවල දී බහුල වශයෙන් මිනී පුළුස්සා ගඟට දැමීම සිදු වූ නමුත් පවිත්‍ර ගංගා වැඩ සටහන යටතේ ඉදිකර ඇති විදුලිමය ආදාහනාගාර හේතුවෙන් මිනී පුළුස්සා දැමීමෙන් සිදු වූ ගංගාවේ ජල දූෂණය අවම කර ගැනීමට හැකි වී තිබේ.

පවිත්‍ර ගංගා වැඩ සටහන විවිධ වූ අංශ වෙත ද යොමු වී ඇත.

පවිත්‍ර ගංගා වැඩ සටහනේ මූලික අරමුණ ගංගා ජලයේ ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම වුව ද එයට අනුබද්ධ පුලුල් වූ ක්‍රියාවලියක් ද සිදු වෙයි.

ගංගා ජලයේ හා නිම්නබද ප්‍රදේශයේ ජෛව විවිධත්ව සංකර්ෂණයට අදාල කාර්යයන් මෙන් ම ගංගා නිම්න කළමණාකරනයට අදාල කාර්යයන් රැසක් ද මේ යටතේ සිදු වෙයි.

## සන්නිවේදන ක්‍රියාවලිය

ඉන්දියානු පවිත්‍ර ගංගා වැඩ සටහනේ අවධානය යොමු විය යුතු තවත් වැදගත් අංශයක් වන්නේ ජන සහභාගිත්වය ලබා ගැනීමේ අරමුණෙන් ක්‍රියාත්මක කෙරෙන ජනාවබෝධ වැඩ සටහන හා සන්නිවේදන ආකෘතියයි.

මෙහිදී අප රටවල දැනුවත් කිරීමේ ඒකායන ක්‍රමය හැටියට සැලකෙන ජන සන්නිවේදන මාධ්‍යයට (පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි) අනුබද්ධව ග්‍රාමකේන්ද්‍රීය අන්තර් පුද්ගල හා කණ්ඩායම් සන්නිවේදන ක්‍රමෝපායන්ද උපයෝගී කර ගැනේ.

ගංගා සේවා දාල් (GSD) නමැති ස්වෙච්ජා සංවිධාන විශේෂය ග්‍රාමීය මට්ටමේ සුවිශේෂ සන්නිවේදන ව්‍යායාමයක යෙදෙයි. පාසැල් සිසුන් දැනුවත් කිරීම ද ඔවුන් ක්‍රියාකාරී ලෙස මේ සඳහා යොදා ගැනීම ද ගංගා සේවා දාල් වැනි රාජ්‍ය නොවන අංශයන් මැදිහත් වීමෙන් සිදු කෙරෙයි.

"ගංගා සේවා - භාරත් සේවා" යන උද්යෝග පාඨය මෙහි දී විශේෂයෙන් භාවිතා කෙරේ.

විදි නාට්‍ය මෙන්ම බිත්ති පුවත් පත් වැනි පාරම්පරික සන්නිවේදන ක්‍රම භාවිතය ද මෙහි කැපී පෙණෙන ලක්ෂණයකි.

පාසැල් සිසුන් කණ්ඩායම් වශයෙන් සංවිධානය කොට සන්නිවේදන ක්‍රියාකාරකම් වලට මෙන්ම ගඟ දියේ ගුණාත්මක තත්ත්වය මනින සරල වූ පරීක්ෂණ සඳහා යොමු කිරීම ද මෙහි දී සිදු වෙයි.

අප මහා සැලසුම් පවා අක්‍රිය වීමට හා අසාර්ථක වීමට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ එයට අනුබද්ධ දේශානුරූපී සන්නිවේදන ක්‍රියාවලියක් ගැන නොසිතීමය.

කෙසේ වුව ද පවිත්‍ර ගංගා වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී එයට අනුබද්ධව ක්‍රියාත්මක කෙරෙන මෙම ග්‍රාම කේන්ද්‍රීය සන්නිවේදන ක්‍රමෝපායක් කෙරෙහි ද අප අවධානය යොමු කිරීම වැදගත් ය. පවිත්‍ර ගංගා වැඩ සටහන යටතේ සිදුවන ක්‍රියාකාරකම් දැනට විල් හා ආශ්‍රිත ඇතැම් ජලාශවලට ද ආදේශ කර ඇත. මෙම ආදර්ශය ශ්‍රී ලංකාවේ බේරේ වැව හා මහනුවර වැව ආදී ජලාශ වලට ද වැදගත් වනු ඇත.











**ඉන්දියානු ජාතික ගංගා සංරක්ෂණ වැඩ සටහනේ නව ප්‍රවනතා**

ගංගා ක්‍රියාත්මක සැලැසමේ 1 වන අදියර සඳහා ඉගෙන ගත් පාඩම් සහ උකහාගත් අත්දැකීම් වල පදනම මත අවශ්‍ය නිවැරදි කිරීම් සමඟ, ගංගා ක්‍රියාත්මක සැලැස්මේ ආකෘතිය (GAP phase 1) ජාතික ගංගා සංරක්ෂණ සැලැස්ම යටතේ රටේ ප්‍රධානතම දූෂිත ගංගා සඳහා යොදාගෙන ඇත.

ගංගා ක්‍රියාත්මක සැලැස්ම යටතේ, දූෂණය අවම කිරීමේ කටයුතු නගර 59 ක ආරම්භ කර ඇති අතර ඉන් 22ක් සහ 14ක් බිහාර ප්‍රාන්තයේ ද 23ක් බටහිර බෙංගාලයේ ද නගර වේ. සැලැස්ම යටත් අවසර දී ඇති දූෂණය අවම කිරීමේ යෝජනා ක්‍රම 115කින් 23ක් පමණ මෙතෙක් දුරට සම්පූර්ණ කර ඇත. ජාතික ගංගා සංරක්ෂණ සැලැස්ම ආරම්භ කිරීමෙන් පසු, ගංගා ක්‍රියාත්මක සැලැස්මේ 1 වන අදියර ජාතික ගංගා සංරක්ෂණ සැලැස්ම හා සම්බන්ධ කිරීමට තීරණය කෙරුණු අතර මේ සම්බන්ධයෙන් දැන්වීමක් නිකුත් කරන ලදී.

දැනට යමුනා ක්‍රියාත්මක සැලැස්ම නගර 21ක දූෂණය අවම කිරීමේ කටයුතු ආවරණය කරන අතර අනුමත වියදම රුපියල් කෝටි 509.45කි. ඉන් රුපියල් 466.63ක් දැනටමත් වියදම් කර ඇත. සැලැස්ම යටත් අවසර දී ඇති දූෂණය අවම කිරීමේ යෝජනා ක්‍රම 141න්, යෝජනා ක්‍රම 106ක් සම්පූර්ණ කර ඇති අතර, ඉතිරිය සම්පූර්ණ කිරීමේ කටයුතු විවිධ අදියර වල පවතී.

ගෝමතී ක්‍රියාත්මක සැලැස්ම යටතේ, ප්‍රථම අදියරේ දී භාර ගැනීම U. P රජය/ U. P ජලනි ගම් ප්‍රමුඛ යෝජනා ක්‍රම 10ක් ලැයිස්තු ගත කර ඇත. NRCD මගින් රු. කෝටි 25.45ක වියදමින් න සැලැස්ම යටතේ ව්‍යාපෘති 06ක් අනුමත කර ඇත.

දමොදාර් ක්‍රියාත්මක සැලැස්ම යටතේ දූෂණය අවම කිරීමේ කටයුතු නගර 12ක සිදු කෙරෙමින් පවතින අතර ඉන් 08ක් ජාහක්කන්ද් හිදී ද, 4ක් බටහිර බෙංගාලයේ ද ඇත. අපද්‍රව්‍යය ML. D ......... 68ක් පමණ බාධා වී ඇති බවට ඉලක්ක කර ඇති අතර, මෙකී වැඩ කටයුතු යටතේ වෙනස් මගකට යොමු කෙරේ.

NRCD .......... ගංගා ක්‍රියාත්මක සැලැස්ම යටතේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහි දී ලබාගත් අත්දැකීම් වලට මහ ජනතාව සම්බන්ධ කර ගැනීම හා සහභාගි කර ගැනීම සඳහා පියවර ගත්තේ ය. ඒ අනුව මේ සම්බන්ධයෙන් එහි මාර්ගෝපදේශ තාවය සාදන ලදී. දේශීය ආයතන සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන පුලුල් ප්‍රචාරය හා ස්වෙච්ඡා සම්බන්ධ වීම් මගින් මහජන සහභාගිත්වයට දැඩි ප්‍රමුඛතාවයක් ලැබේ.

නම් වශයෙන් මහා රාෂ්ට ප්‍රාන්තයේ ඇති පොවායි සහ තමිල්නාඩුවේ ඌටි සහ කොඩායිකාගල් යන විල් තුන සංරක්ෂණය කිරීමේ යෝජනාවත් ජාතික විල් සංරක්ෂණ සැලැස්ම යටතේ අනුමත කෙරුණ අතර ඇස්තමේන්තු ගත වියදම රුපියල් කෝටි 14.90කි.

සුනිල් සරත් පෙරේරා,
අතිරේක ලේකම්,
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය



